Verité Research
Strategic Analysis for Asia

# ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ ඇගැයීම

ජුලි 2021

# ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ ඇගැයීම

ජුලි 2021

මෙම අධ්‍යයනය වෙරිටේ රිසර්ච් ආයතනයේ (ඩැරසඑඞී සෲැරජය) ආර්ථික විද්‍යා කණ්ඩායම විසින් සම්පාදනය කරන ලද්දකි. නයිජල් ග්‍රේ සහ උදාහිරුණි අතපත්තු යන අයගෙන් මෙම කණ්ඩායම සමන්විත විය. ලහිරි ජයසිංහ, යස්මින් රාජි, ටිරනි විජේවික්‍රම, සල්මා රාසික් සහ දිනුක් ද සිල්වා විසින් ඊට පර්යේෂණ සහාය ලබා දෙන ලදි. පර්යේෂණය සඳහා සමස්ත මඟ පෙන්වීම, අන්තර්ගතය පිළිබඳ  ඇගැයීම සහ අධීක්ෂණය නිෂාන් ද මෙල් සහ දෙෂාල් ද මෙල් විසින් සිදු කරන ලදී. ඇගැයීම් සහ සංස්කරණ සහාය, හස්නා මුනාස් සහ ස්ටෙෆනි නිකෝල් විසින් ලබා දෙන ලදී. සැකසුම සහ නිර්මාණය දිනුක් සේනාපතිරත්න විසින් සිදු කරන ලදි.

විද්‍යුත් තැපෑලෙන් අදහස් යොමු කිරීමට: publications@veriteresearch.org

ප්‍රකාශන හිමිකම © 2021 වෙරිටේ රිසර්ච් පුද්ගලික සමාගම. සියලුම හිමිකම් ඇවිරිණි.

ග්‍රේ, නයිජල්
ස්ත්‍රී පුරුෂ සමජභාවයට අනුකූල වූ අයවැයකරණය : ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ ඇගයීම / නයිජල් ග්‍රේ සහ උදාහිරුණි අතපත්තු.
කොළඹ : වෙරිටේ රිසර්ච්, 2021
පි. 38 ; සෙමී. 26.

ISBN 978-624-5514-12-0

i . ඩිව් ii. අතපත්තු, උදාහිරුණි (සම කර්තෘ)
iii. ග්‍රන්ථ නාමය

1. අයවැය - ශ්‍රී ලංකාව
2. ස්ත්‍රී පුරුෂ සමජභාවය - ආර්ථික දෘෂ්ටිය

ISBN: 978-624-5514-16-8

නිර්දේශිත උපුටා දැක්වීම: වෙරිටේ රිසර්ච් (Verité Research) (2021). ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය: ප්‍රධාන කාර්ය සාධන දර්ශක පිළිබඳ ඇගැයීම. කොළඹ, වෙරිටේ රිසර්ච්.

මූලික පද: ස්ත්‍රී පුරුෂ සමාජභාවී අයවැයකරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආර්ථික විද්‍යාව

වෙනත් පර්යේෂණ වාර්තා පහත සබැඳියෙන් බාගත කළ හැකිය:
https://www.veriteresearch.org/publication_type/research-reports/

ඔබගේ අදහස් විද්‍යුත් තැපෑල මාර්ගයෙන් යොමු කරන්න : publications@veriteresearch.org

# පටුන


හැඳින්වීම ...... 5

ඇගැයීම සඳහා යොදා ගත් ක්‍රමවේදය ...... 7

දත්ත එක්රැස් කිරීම ...... 7

ප්‍රගතිය ඇගැයීම ...... 7

2018-2019 කාලය තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ...... 9

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගැයීමේදී මුහුණ දුන් අභියෝග ...... 16

ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්හි නිර්වචනවල පැහැදිලිබව අඩු වීම ...... 16

අධීක්ෂණය අවම වීම ...... 16

තොරතුරු අනාවරණය දුර්වල වීම ...... 17

වාර්තාකරණයේ ඇති නොගැලපීම් ...... 17

කැබිනට් සංශෝධන හේතුවෙන් ඇති වන අකාර්යක්ෂමතා ...... 17

නිගමනය ...... 19

ඇමුණුම් ...... 20

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ගොනු කළ තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර ...... 20

ප්‍ර.කා.සා.ද. 1 - ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම ...... 23

ප්‍ර.කා.සා.ද. 2 - මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම ...... 24

ප්‍ර.කා.සා.ද. 3 - ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව ...... 25

ප්‍ර.කා.සා.ද. 4 - ජාතික වෘත්තීය පුහුණු සහතිකය (හඩු) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තීය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව ...... 26

ප්‍ර.කා.සා.ද. 5 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයන්ගේ සංඛ්‍යාව ...... 27

ප්‍ර.කා.සා.ද. 6 - ආපසු පැමිණ හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව ...... 28

ප්‍ර.කා.සා.ද. 7 - ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව ...... 29

ප්‍ර.කා.සා.ද. 8 - ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම ...... 30

ප්‍ර.කා.සා.ද. 9 - ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව ...... 31

ප්‍ර.කා.සා.ද. 10 - කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව ...... 32

ප්‍ර.කා.සා.ද. 11 - ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ/ හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව ...... 33

ප්‍ර.කා.සා.ද. 12 - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ...... 34

2018 අයවැය කැඳවීම සඳහා අතිරේකය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 (ප්‍ර.කා.සා.ද.) ...... 35

# ප්‍රදර්ශිතයන්

**ප්‍රදර්ශිතය 1:** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක ...................... 5

**ප්‍රදර්ශිතය 2:** ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 සඳහා ප්‍රගති සාරාංශය (ප්‍ර.කා.සා.ද.) .................................................. 9

# හැඳින්වීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය ඉහළ නැංවීමේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය පසුගිය දශකය තුළ අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතී ඇති. වෙරිටේ රිසර්ච් විසින් පෙර කරන ලද විශ්ලේෂණයකින් හෙළි වූයේ 2010-2019 කාල සීමාව සඳහා ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පරතරය පිළිබඳ දර්ශකයේ (Global Gender Gap Index - GGGI) ශ්‍රී ලංකාවේ පහත වැටීම බොහෝ දුරට රාජ්‍ය නායකයාගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දර්ශකය මගින් මෙහෙයවනු ලැබූ බවයි. මෙම දර්ශකය ඉවත් කිරීමෙන් ශ්‍රී ලංකාවේ GGGI අගය නොවෙනස්ව පවතින අතර එයින් හැඟවෙන්නේ රටේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පරතරය අවම කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා නොමැති බවයි.[1]

2018 අයවැය කැඳවුමේදී, මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව (ජා.අ.දෙ.) 2017-2019 සිට මධ්‍ය කාලීන අයවැය රාමුව යටතේ ක්‍රියාත්මක කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල අයවැයකරණය සඳහා නව ප්‍රතිපත්ති උපාය මාර්ග යක් හඳුන්වා දුන්නේය. ඒ අනුව, අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිල්ලට ගැනීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සියළුම කැබිනට් අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ සහ පළාත් සභා සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (ප්‍ර.කා.සා.ද.) 12 ක් සකස් කළේය. (ප්‍රදර්ශිතය 1 බලන්න) ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ගෙන් 5 වන ඉලක්කයට අනුකූලව මෙම ප්‍ර.කා.සා.ද. සැකසීමට නියමිතව තිබුණි.[2]

**ප්‍රදර්ශිතය 1:** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක

| ප්‍ර.කා.සා.ද. | ශීර්ෂය |
|---|---|
| 1 | ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම |
| 2 | මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම |
| 3 | ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව |

1 රිඩියුසින් ද ගැප් ඉන් අන්ඩ්ස්ටෑන්ඩින් ශ්‍රී ලංකාස් ජෙන්ඩර් ගැප්/ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය අවබෝධ කර ගැනීමේ පරතරය අඩු කිරීම [Reducing the Gap in Understanding Sri Lanka's Gender Gap], ඩේලි මිරර්, 4 මාර්තු 2021, http://www.dailymirror.lk/features/Reducing-the-gap-in-understanding-Sri-Lankas-gender-gap/185-206989 දී. [අවසන් පිවිසුම 24 මැයි 2021]

2 වෙබ්සයිට් ඔෆ් ද යුනයිටඩ් නේෂන්ස්/එක්සත් ජාතීන්ගේ වෙබ් අඩවිය [Website of the United Nations], ආර්ථික සමාජ කටයුතු දෙපාර්තමේන්තුව, අචීව් ජෙන්ඩර් ඊක්වොලිටි ඇන්ඩ් එම්පවර් ඕල් විමෙන් ඇන්ඩ් ග(ර්)ල්ස්/ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියළුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම ['Achieve gender equality and empower all women and girls'], https://sdgs.un.org/goals/goal5 දී [අවසන් පිවිසුම 31 මැයි 2021]

| | |
|---|---|
| 4 | ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තීය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව |
| 5 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයන්ගේ සංඛ්‍යාව |
| 6 | ආපසු පැමිණ හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව |
| 7 | ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව |
| 8 | ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම |
| 9 | ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව |
| 10 | කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව |
| 11 | ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ/ හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව |
| 12 | ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව[3]

සියලුම අමාත්‍යාංශ හා පළාත් සභා විසින් මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ජා.අ.දෙ. වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. මීට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයක් ස්ථාපනය කිරීමට මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත ගබඩා සහ තොරතුරු පද්ධති කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලෙසද මෙම මහජන බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලදි.

මෙම වාර්තාවේ අරමුණු දෙයාකාර ය. ඉන් පළමු අරමුණ ලෙස, ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලධාරීන් විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව මෙම එක් එක් ප්‍ර.කා.සා.ද. කොතරම් දුරට ප්‍රගතියක් ලබා ඇත්දැයි තක්සේරු කිරීමට උත්සාහ දරයි. දෙවනුව, මෙම ප්‍ර.කා.සා.ද. පිළිබඳ තොරතුරු රජය විසින් ලේඛනගත කර අධීක්ෂණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රධාන ගැටළු සහ පරතරයන් වාර්තාව විසින් ඉස්මතු කෙරේ.

3 වැඩි විස්තර සඳහා ඇමුණුම බලන්න.

# ඇගැයීම සඳහා යොදා ගත් ක්‍රමවේදය

## දත්ත එක්රැස් කිරීම

ප්‍ර.කා.සා.ද.හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා, වෙරිටේ රිසර්ච් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා අදාළ රජයේ ආයතන වෙත තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම ආයතනවල සවිස්තරාත්මක ලැයිස්තුවක් සහ එම ඉල්ලීම්වලට අදාළ තොරතුරු වර්ගය දැන ගැනීම සඳහා, ඇමුණුම 1 බලන්න.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම් ගොනු කිරීමට අමතරව, ප්‍ර.කා.සා.ද. ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාක්ෂි සඳහා වෙරිටේ රිසර්ච් විසින් අන්තර්ජාල වෙබ් සෙවුම් ද සිදු කරන ලදී. මෙම ප්‍ර.කා.සා.ද. වල ප්‍රගතිය ඇගැයීමේ කාල සීමාව ලෙස 2018 - 2019 ගෙන ඇත.

## ප්‍රගතිය ඇගැයීම

ප්‍ර.කා.සා.ද. පුළුල් ලෙස වෙනස් වන හෙයින්, ප්‍ර.කා.සා.ද. හි ස්වභාවය මත පදනම්ව ප්‍රගතිය තක්සේරු කරන ලදී.

ස්වභාවයෙන් ව්‍යවස්ථාදායි, නියාමනික හෝ ප්‍රතිපත්ති මත පදනම් වූ හෝ ප්‍ර.කා.සා.ද. වල ප්‍රගතිය (එනම් ප්‍ර.කා.සා.ද. 6, 9 සහ 11) පහත දැක්වෙන කාණ්ඩ තුනෙන් එකකට වැටෙන සේ සලකා ඇගැයීමට ලක් කරන කරන ලදී:

- **ප්‍රගතියක් නැත:** ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් ලබා ගත නොහැකි විය; හෝ ලබාගත් තොරතුරු ඇගැයීමක් වෙනුවෙන් භාවිතා කිරීමට තරම් සුදුසු නොවීය; හෝ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ඇගැයීමට අදාළ කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිට කිසිදු වෙනසක් වාර්තා කර නැත; හෝ ලබාගත් තොරතුරු මඟින් ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි කිසිදු ප්‍රගතියක් සිදු නොවූ බව දක්වා ඇත.

- **දුර්වල ප්‍රගතිය:** ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය සඳහා දායක වන එක් ප්‍රතිපත්තියක් / ව්‍යවස්ථාදායි / නියාමනික වෙනසක් පමණි.

- **ශක්තිමත් ප්‍රගතිය:** ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය සඳහා දායක වන ප්‍රතිපත්ති/ ව්‍යවස්ථාදායි / නියාමනික වෙනස්කම් එකකට වඩා ඇගැයීමට අදාළ කාල සීමාව තුළ සිදු විය.

ප්‍රමාණ කළ හැකි / සංඛ්‍යාත්මකව මැනිය හැකි ප්‍ර.කා.සා.ද. සඳහා ප්‍රගතිය (එනම් ප්‍ර.කා.සා.ද. 1,2, 3, 4, 5, 7, 8, 10 සහ 12) පහත දැක්වෙන කාණ්ඩ හතරෙන් එකකට වැටෙන සේ සලකා ඇගැයීමට ලක් කරන ලදී:

- **ප්‍රගතියක් නැත:** ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් ලබා ගත නොහැකි විය; හෝ ලබාගත් තොරතුරු ඇගැයීමක් වෙනුවෙනේ භාවිතා කිරීමට තරම් සුදුසු නොවීය; හෝ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ඇගැයීමට අදාළ කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිට වටිනාකමෙහි කිසිදු වෙනසක් වී නැත; හෝ ලබාගත් තොරතුරු මඟින් ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි කිසිදු ප්‍රගතියක් සිදු නොවූ බව දක්වා ඇත.

- **පිරිහෙන ප්‍රගතිය:** ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය අඩුවී / නරක අතට හැරී ඇත (එනම්, මැන බැලෙන දර්ශකය ඇගැයීමට අදාළකාල සීමාව තුළ ඍණාත්මක වර්ධනයක් වාර්තා කර ඇත).


- **දුර්වල ප්‍රගතිය:** ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ලෙස 0 සිට 10% දක්වා අගයක වැඩි වීමක් වාර්තා විය.

- **ශක්තිමත් ප්‍රගතිය:** ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ලෙස 10% ට වඩා වැඩි අගයක් වාර්තා විය.

# 2018-2019 කාලය තුළ ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය

සාරාංශයක් ලෙස ගත් කළ, ප්‍ර.කා.සා.ද. 10 ක් කිසිදු ප්‍රගතියක් නොමැති බවට තක්සේරු කර ඇති අතර ඉතිරි ප්‍ර.කා.සා.ද. 2 දුර්වල ප්‍රගතියක් වාර්තා කර ඇත (ප්‍රදර්ශිතය 2 බලන්න).

**ප්‍රදර්ශිතය 2:** ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 සඳහා ප්‍රගති සාරාංශය (ප්‍ර.කා.සා.ද.)



ප්‍ර.කා.සා.ද.
1

## ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම

ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය 2018 දී 33.6% සිට 2019 දී 34.5% දක්වා වැඩි විය. මෙම ඉහළ යාම දර්ශකය සඳහා පනවා තිබූ 10% සීමාවට වඩා අඩු වූ අතර එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. දුර්වල ප්‍රගතියක් ඇති ලෙසට වර්ගීකරණය කර ඇත.

**දුර්වල ප්‍රගතිය**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 28**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
2

## මූලාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම

තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**අදාළ නොවේ**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
3

## ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**අදාළ නොවේ**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
4

## ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තීය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව

*ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගත්කාන්තාවන්ගේ ප්‍රතිශතය 2018 දී 39.3% සිට 2019 දී 42.6% දක්වා ඉහළ ගොස් තිබේ. මෙම ඉහළ යාම දර්ශකය වෙනුවෙන් පනවා තිබූ 10% සීමාවට වඩා අඩු වූ අතර එබැවින් මෙම ප්‍ර.කා.සා.ද.ය දුර්වල ප්‍රගතියක් ඇති ලෙසට වර්ගීකරණය කර ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ කාන්තාවන්ට රැකියා ලැබීම පිළිබඳ භාවිතයට ගතහැකි තොරතුරු ලැබී නැත.*

**දුර්වල ප්‍රගතිය**

ප්‍රගතියේ වර්ගීකරණය

**අදාළ නොවේ**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
5

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයන්ගේ සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 70 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
6

## ආපසු පැමිණ හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 3 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද. 7

## ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 4 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද. 8

## ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 93 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
9

## ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**අදාළ නොවේ**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද.
10

## කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 38 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද. 11

## ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ/ හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව

*තොරතුරු දැනගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් අධිකරණ අමාත්‍යාංශය ප්‍රකාශ කළේ තක්සේරු කාලය තුළ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීමේ නීති කිසිවක් සංශෝධනය කර / බලාත්මක කර නොමැති බවයි. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 12 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

ප්‍ර.කා.සා.ද. 12

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය

*තොරතුරු දැන ගැනීමේ අයිතිය (තො.දැ.අ.) යටතේ කළ ඉල්ලීම් හරහා හෝ මාර්ගගත අන්තර්ජාල ඇගැයීම් හරහා හෝ භාවිතයට ගත හැකි තොරතුරු ලැබී නැත.*

**ප්‍රගතියක් නැත**

ප්‍රගතියේ වර්ගීකරණය

**රු. මිලියන 62 යි**

මුළු වියදම

ඇමුණුම බැලීමට මෙතැන ක්ලික් කරන්න

# ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගැයීමේදී මුහුණ දුන් අභියෝග

ඇගැයීම් ක්‍රමවේදය හැකි තරම් වෛෂයික වන ආකාරයට නිර්මාණය කර තිබුණද, ලබාගත් තොරතුරු වල ඇති අඩුපාඩු හා නොගැලපීම් හේතුවෙන් මෙම ප්‍ර.කා.සා.ද. වල ප්‍රගතිය ඇගැයීම අභියෝගාත්මක විය. එලෙෂ මුහුණ දෙන ලද ප්‍රධාන අභියෝග සහ ඒවාට පිළියම් යෙදීමට ගත් පියවර පිළිබඳව මෙම කොටසේදී සාකච්ඡා කෙරේ.

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්හි නිර්වචනවල පැහැදිලිබව අඩු වීම

ප්‍ර.කා.සා.ද. 12 න් කිසිවක් නිශ්චිත කාල රාමුවක් තුළ ළඟා කර ගත යුතු හෝ පවත්වාගෙන යා යුතු හෝ ඉලක්කගත අගයක් නියම කර නැත. ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතියට අදාළ තොරතුරු ලබා ගත්තද, ඉහත කරුණ හේතුවෙන් ඉලක්කයකට සාපේක්ෂව ප්‍රගතිය සංසන්දනය කර එය කෙතරම් ප්‍රගතියක් ලබා ඇත්දැයි ඇගැයීමට නොහැකි වූ නිසා මෙය ගැටළුසහගතබවක් ඇති කළේය

ඉලක්කයේ පැහැදිලිබවක් නොමැතිවීමේ ගැටළුවට විසඳුම ලෙස, ඇගැයීම් කණ්ඩායම දුර්වල ප්‍රගතිය සඳහා සීමාවක් නිර්වචනය කළේ ස්වභාවයෙන් නියාමනික හෝ ව්‍යවස්ථාදායි වන ප්‍ර.කා.සා.ද. සම්බන්ධයෙන් ඇගැයීමට අදාළ කාල සීමාව තුළ එක් ප්‍රතිපත්තියක් / ව්‍යවස්ථාදායි / නියාමනික වෙනසක් පමණක් සිදු කිරීම සහ අනෙකුත් සියලුම ප්‍ර.කා.සා.ද. සඳහා 10% වර්ධනය වීමක් ලෙසය. නිදසුනක් ලෙස, ප්‍ර.කා.සා.ද. 12 ප්‍රකාශ කර ඇත්තේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට විසඳුම් සෙවීම සඳහා බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ලෙස ය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපාදන කාලයත් සමඟ වැඩි වේ ද, නැතහොත් එය යම් කිසි අවම සීමාවක් සපුරාලිය යුතුද යන්න නිශ්චිතව දක්වා නැත. දක්වා ඇති ඇගැයීමේදී, 10% වාර්ෂික වර්ධනයක් දුර්වල ප්‍රගතියක් ලෙස දක්වා ඇති අතර ඊට ඉහළ වර්ධනයක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස සලකන ලදී.

පැහැදිලි ඉලක්කයක් නොමැතිකමට අමතරව, ප්‍ර.කා.සා.ද. හි පුළුල් නිර්වචනයන්ම හේතුවෙන් ඒවා ප්‍රගතියක් අත්කර ගෙන ඇත්දැයි ඇගැයීම දුෂ්කර විය. උදාහරණයක් ලෙස, ප්‍ර.කා.සා.ද. 7 දක්වා ඇත්තේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තුළින් ලබා ගන්නා තීරණ ගැනීමේ තනතුරුවල සිටින කාන්තාවන් සංඛ්‍යාව වැඩි වී ඇති ප්‍රමාණය ලෙස ය. කෙසේ වෙතත්, ඇගැයීමට අදාළ කාල සීමාව තුළ තීරණ ගැනීමේ තනතුරුවල සිටින කාන්තාවන්ගේ සංඛ්‍යාවේ පෙන්නුම් කළ යම් වැඩිවීමක් ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල ඍජු ප්‍රතිඵලයක් ලෙ සිදු වුණිද නැතිනම්ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර තබුණද නොතිබුණද උසස්වීම් ලද කාන්තාවන්හට මෙම තනතුරු එලෙසින්ම ලැබෙනු ඇතිදැයි යන්න නිර්ණය කිරීමට නොහැකි විය.

## අධීක්ෂණය අවම වීම

සියලුම අමාත්‍යාංශ හා පළාත් සභාවලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ වගකීම පවතින මහජන අධිකාරීන් වන්නේ මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වේ. මෙම ප්‍ර.කා.සා.ද. වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම 2018 අයවැය කැඳවුමෙන් මුදල් අමාත්‍යාංශයට පැවරිණිත. මෙලෙස නියම කරතිබියදීත්, අධීක්ෂණ ආයතන දෙකෙන් එකක්වත් මෙම ප්‍ර.කා.සා.ද. වල ප්‍රගතිය සොයා ගැනීමට සහ ඇගැයීමට භාවිතා කළ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු සැපයුවේ නැත. මෙලෙස තොරතුරු නොමැතිවීම මෙන්ම තොරතුරු අනාවරණය කිරීමක් නොමැතිවීම හා

එක්ව ගත් කළ හැඟවෙන්නේ මෙම අධීක්ෂණ ආයතන විම ප්‍ර.කා.සා.ද.වල ප්‍රගතිය කාර්යක්ෂම ලෙස මැනීම සිදු නොකරන බව සහ අපේක්ෂිත මට්ටමේ කාර්ය සාධනයකින් කිසියම් බැහැර වීමක් සිදු වුණහොත් ඒ පිළිබඳ දැනුම් දීමක් සිදු නොකරන බවත්ය.

## තොරතුරු අනාවරණය දුර්වල වීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ සඳහන් වන්නේ, 'මෙම පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම පුරවැසියෙකුටම මහජනයා සන්තකයේ, භාරයේ හෝ පාලනයෙහි ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඇත.'යනුවෙනි. එසේ තිබියදීත්, වෙරිටේ රිසර්ච් විසින් ගොනු කරන ලද තො.දැ.අ. පිළිබඳ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් ලබාගත් තොරතුරු බොහෝ දුරට ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ඇගැයීමටප්‍රමාණවත් නොවීය. නිදසුනක් වශයෙන්, මුදල් අමාත්‍යාංශය විසින් නිශ්චිත ප්‍ර.කා.සා.ද.වලට අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලද රාජ්‍ය බලධාරීන්ගේ ලැයිස්තුවක් සැපයූ නමුත්, මෙම බලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද්දේ කුමන වර්ගයේ තොරතුරුද යන්න පිළිබඳ හෝ ප්‍ර.කා.සා.ද.හි ප්‍රගතිය ඇගැයීමට මෙය භාවිතා කළේ කෙසේද යන්න පිළිබඳ හෝ වැඩිදුර තොරතුරු ලබා දුන්නේ නැත.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද දත්ත පදනම් කර ගනිමින් ප්‍ර.කා.සා.ද. සම්බන්ධ වියදම් පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් වියදම් කරනු ලබන මුදල්වලට සමබන්ධද නැතහොත් ප්‍ර.කා.සා.ද. ක්‍රියාත්මක කරන සියලුම මහජන අධිකාරීන්ට සම්බන්ධද යන්න නිශ්චිතව දක්වා නැත.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කරන ලද ඉල්ලීම් මගින් ලැබුණු තොරතුරු සීමිත වීමේ ගැටළුව, ප්‍ර.කා.සා.ද. ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාක්ෂි සෙවීම සඳහා සිදු කරන ලද මාර්ගගත අන්තර්ජාල සෙවුම් ඔස්සේ ලබාගත් තොරතුරු සීමිත වීම හේතුවෙන් සංකීර්ණවිය.

## වාර්තාකරණයේ ඇති නොගැලපීම්

ඇතැම් අවස්ථාවලදී, මහජන අධිකාරීහු එකම මිනුම සඳහා විවිධ අගයන් වාර්තා කළහ. වාර්තාකරණයේ මෙම නොගැලපීම ප්‍රගතිය තක්සේරු කිරීමේදී කුමන අගය භාවිත කළ යුතු ද යන්න පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති කළේය. උදාහරණයක් ලෙස, 4 වන ප්‍ර.කා.සා.ද. සඳහා, යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් ලබා ගන්නා කාන්තාවන්ගේ ප්‍රතිශතය 2018 සහ 2019 දී පිළිවෙලින් 67.9% සහ 66% ක් ලෙස වාර්තා කර ඇත (ජාතික තරුණ සේවා සභාව විසින් ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව). කෙසේ වෙතත්, නිපුණතා සංවර්ධන, සේවා නියුක්තිය හා කම්කරු සබඳතා පිළිබඳ අමාත්‍යාංශය ප්‍රකාශ කළේ එම කාලය තුළ අගයන් 75.3% සහ 64.8% ක් බවයි.

## කැබිනට් සංශෝධන හේතුවෙන් ඇති වන අකාර්යක්ෂමතා

අනුප්‍රාප්තික රජයන් විසින් නිරන්තරයෙන් සිදු කරනු ලබන කැබිනට් සංශෝධනයන් ශ්‍රී ලංකාවට ආගන්තුක නොවේ. නිරන්තරයෙන් සිදු වනඅමාත්‍යාංශ බෙදීම හා ඒකාබද්ධ කිරීම් හේතුවෙන් මධ්‍යම ආණ්ඩුවේ සම්බන්ධීකරණය හා වගවීම අවම වීම සිදුවේ[4] ප්‍ර.කා.සා.ද. ක්‍රියාත්මක කිරීමේදී ද මෙම කරුණු පැහැදිලිව දක්නට ලැබේ.

2020 අගෝස්තු මාසයේදී, ජනාධිපතිවරණයෙන් හා නව රජයක් පත් කිරීමෙන් පසුව, ප්‍ර.කා.සා.ද. ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අධීක්ෂණ ආයතනයක් වූ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ඉවත් කරන ලදී. ඒ වෙනුවට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවන ලදී.[5] මෙම විශ්ලේෂණය සඳහා යොදා ගත් කාල සීමාවෙන් පිටත මෙම වෙනස සිදු වූ

4 වෙරිටේ රිසර්ච්, අ රැෂනල් මෙතඩ් ෆො කැබිනට් ෆෝමේෂන් ඉන් ශ්‍රී ලංකාඨ අ වයිට් පේපර්/ශ්‍රී ලංකාවේ කැබිනට් මණ්ඩලය සැකසීම උදෙසා තාර්කික ක්‍රමවේදයක්ඨ ධවල පත්‍රිකාවකි [*A Rational Method for Cabinet Formation in Sri Lanka: A White Paper*], අගෝස්තු 2020, at https://www.veriteresearch.org/publication/cabinet-white-paper-sri-lanka/ [අවසන් පිවිසුම 09 ජූනි 2021].

5 2020 අගෝස්තු 09 වැනි දින නිකුත් කරන ලද අංක 2189/27 දරන අතිවිශේෂ ගැසට්ටුව, http://www.documents.gov.lk/files/egz/2020/8/2187-27_E.pdf [අවසන් පිවිසුම 09 ජූනි 2021]

නමුත් මෙම වෙනසෙන් පසු පෙර පැවති කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වගකීම් වෙනත් අමාත්‍යාංශ හරහා වෙන් වී දුර්වල වීමටඉඩ ඇති නිසා එය සැලකිලිමත් වීමට හේතුවක් පෙන්නුම් කරයි.

මෙම උදාහරණය කාලයත් සමඟ සිදු වූ බොහෝ කැබිනට් වෙනස්කම් වලින් එකකි. මෙම නිරන්තර වෙනස්වීම්වල එකතුව මඟින් ආණ්ඩුවේ යම් කාර්යයක් සඳහා කුමන අමාත්‍යාංශය වගකිව යුතුද යන්න හඳුනා ගැනීමේ දුෂ්කරතාව පෙන්නුම් කරන අතර එමඟින් දුර්වල කාර්ය සාධනය සඳහා අධිකාරීන් වගවීමෙහි හෙබවීම සඳහා ඇති හැකියාවට බාධා පමුණුවයි.

# නිගමනය

2018 අයවැය කැඳවුම තුළින් ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතාවය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍ර.කා.සා.ද. හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ වැදගත් සමාජ ආර්ථික ගැටළුවක් විසඳීමට උත්සාහ කළ ධනාත්මක පියවරකි. කෙසේ වෙතත්, මෙම මුල් පිරිම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සීමිත අධීක්ෂණයක් පවත්වා ඇති බව පැහැදිලිය. සෑම ප්‍ර.කා.සා.ද.ක්ම එය සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් ලබාඇත්තේ සුළු ප්‍රගතියක් හෝකිසිදු ප්‍රගතියක් නොමැති බව හෙළිවේ.

ප්‍ර.කා.සා.ද වල ප්‍රගතියක් දක්නට නොලැබීම අධීක්ෂණය හා පසු විපරම් නොමැතිකම සමඟ සම්බන්ධ වී තිබීමට බොහෝ දුරට ඉඩ ඇත. ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරී ප්‍රයත්නයක් තිබුණි නම්, එය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්ට, ඒවාට පැවරී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් දිරිගැන්වීමක් නිර්මාණය කරනු ඇත. එනිසා, අභ්‍යන්තර රාජ්‍ය ආයතන තුළ පවා ඵලදායී අධීක්ෂණ හා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් නොමැති නම් ධනාත්මක ප්‍රතිපත්තිමය මුලපිරීමක් පවා සමාජයට සීමිත ප්‍රතිඵල ලබා දෙන බව පැහැදිලිය.

අධීක්ෂණයක් නොමැතවීම හේතුවෙන් පැන නගින දුර්වල ලෙස ක්‍රියාත්මක කිරීමේ ගැටළුව උග්‍ර වන්නේ මෙම ප්‍ර.කා.සා.ද වල ප්‍රගතියට අදාළ තොරතුරු පිළිබඳ මහජනයාට අනාවරණය නොවීම නිසාය. මහජන අරමුදල් උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳ මහජන අධීක්ෂණයක් නොමැතිකම, මහජන බලධාරීන් ඒ පිළිබඳ වගකියන තත්ත්වයට පත් කිරීමට මහජනතාවට ඇති හැකියාව සීමා කරයි.

ඊටත් වඩා ගැටළුසහගත කරුණ නම්, සමහර මුලපිරීම්වල වියදම් වාර්තා වී ඇති නමුත් ප්‍රගතිය හෝ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් ලබා නොදීමයි. නිදසුනක් ලෙස, 'සංශෝධනය කරන ලද, බලාත්මක කරන ලද සහ / හෝ ක්‍රියාත්මක කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ගණන ලෙස දැක්වෙන ප්‍ර.කා.සා.ද. 11, රුපියල් මිලියන 12 ක වියදමක් වාර්තා කර ඇති නමුත් අධිකරණ අමාත්‍යාංශය සැපයුතොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිචාරයකට අනුව ඇගැයීමට අදාළ කාල සීමාවසඳහා එම ප්‍ර.කා.සා.ද.ය කිසිදු ප්‍රගතියක් වාර්තා කර නැත. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදීවගකීම පැහැර හැරීමක් සිදු වන බව මෙයින් පෙන්නුම් කෙරේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ 5 වන තිරසාර සංවර්ධන ඉලක්කය 2030 වන විට රටවල් විසින් අත්කර ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් එකකි. ශ්‍රී ලංකාව තුළ මුල්පිරීම් සිදු වූවත්, අධීක්ෂණය හා වගවීම නොමැතිකම වැඩි ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවයක් සහතික කිරීම කරා ගමන් කිරීමේ හැකියාවට සැලකිය යුතු ලෙස බාධා පමුණුවන බව මෙම වාර්තාව පෙන්වා දී ඇත.

# ඇමුණුම්

## තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ගොනු කළ තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර

| | රාජ්‍ය ආයතන/ය | ආයතනයේ/වල කාර්යභාරය | ඉල්ලුම් කරන ලද තොරතුරු |
|---|---|---|---|
| 1 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (ජා.අ.දෙ.) | අයවැය සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණ ආයතනය. | රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රජයේ ආයතනවලින් 2018-2019 කාල සීමාව සඳහා ලබාගත් සියලුම ප්‍ර.කා.සා.ද. 12 හි ප්‍රගතිය. |
| 2 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද තොරතුරු පද්ධති නඩත්තු කිරීම සඳහා අධීක්ෂණ ආයතනය. | රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රජයේ ආයතනවලින් 2018-2019 කාල සීමාව සඳහා ලබාගත් ප්‍ර.කා.සා.ද. 12 සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද තොරතුරු පද්ධතිවල ප්‍රගතිය. |
| 3 | අ) මුදල් අමාත්‍යංශය<br>ආ) රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ප්‍ර.කා.සා.ද. 3 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම වෙනුවෙන් පත් කර ඇති අමාත්‍යංශ | ▪ 2017-2019 කාල සීමාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද තොරතුරු පද්ධති පවත්වාගෙන යන රාජ්‍ය ආයතන ගණන;<br>▪ ප්‍ර.කා.සා.ද 3 හා/හෝ 5 වන තිරසාර සංවර්ධන ඉලක්කයට සම්බන්ධ ව්‍යාපෘති ලැයිස්තුව (අදාළ ක්‍රියාකාරී සැලසුම් සමඟ);<br>▪ ප්‍ර.කා.සා.ද ක්‍රියාවට නැංවීම නොකරන ලද අවස්ථාවක හෝ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා නොකළ අවස්ථාවක හෝ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට පවතින් අනාගත සැලසුම්. හේතු සහ පැහැදිලි කිරීම් අඩංගු නිල ලේඛන ඇතුළත් වේ;<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු; සහ<br>▪ අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති ලැයිස්තුව. |

| | රාජ්‍ය ආයතන/ය | ආයතනයේ/වල කාර්යභාරය | ඉල්ලුම් කරන ලද තොරතුරු |
|---|---|---|---|
| 4 | ආ) නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු හා පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය<br>ආ) තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය | ප්‍ර.කා.සා.ද. 4 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම පිණිස පත් කරනු ලැබූ අමාත්‍යංශ | ▪ 2017-2019 කාල සීමාව තුළ ජාතික වෘත්තීය පුහුණු සහතිකය ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය සහ තාක්ෂණික වෘත්තීය ක්ෂේත්‍රයේ රැකියා ලබාගත් කාන්තාවන්ගේ සංඛ්‍යාව;<br>▪ ප්‍ර.කා.සා.ද 4 හා/හෝ 5 වන තිරසාර සංවර්ධන ඉලක්කයට සම්බන්ධ ව්‍යාපෘති ලැයිස්තුව (අදාළ ක්‍රියාකාරී සැලසුම් සමඟ);<br>▪ ප්‍ර.කා.සා.ද ක්‍රියාවට නැංවීම නොකරන ලද අවස්ථාවක හෝ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා නොකළ අවස්ථාවක හෝ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට පවතින අනාගත සැලසුම්. හේතු සහ පැහැදිලි කිරීම් අඩංගු නිල ලේඛන ඇතුළත් වේ;<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු; සහ<br>▪ අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති ලැයිස්තුව. |
| 5 | අ) රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>ආ) මුදල් අමාත්‍යාංශය<br>ඇ) කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | ප්‍ර.කා.සා.ද. 7 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට පත් කරනු ලැබූ අමාත්‍යංශ | ▪ 2017-2019 කාල සීමාව සඳහා තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව<br>▪ ප්‍ර.කා.සා.ද. 7 සහ / හෝ ති.ස.ඉ 5 සමඟ සම්බන්ධිත ව්‍යාපෘති ලැයිස්තුව (අදාළ ක්‍රියාකාරී සැලසුම් සමඟ);<br>▪ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක නොවූ හෝ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා නොකළ අවස්ථාවක ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට පවතින අනාගත සැලසුම්. හේතු සහ පැහැදිලි කිරීම් අන්තර්ගත නිල ලේඛන ඇතුළත් වේ;<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු; සහ<br>▪ අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති ලැයිස්තුව. |
| 6 | ජාතික ආරක්ෂාව, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | ප්‍ර.කා.සා.ද. 9ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට පත් කරනු ලැබූ අමාත්‍යාංශය | ▪ 2017-2019 කාල පරිච්ඡේදය තුළ බේරා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය යන ආපදා අවධීන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු විසඳීම සඳහා සම්පාදනව කරන ලද හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ගණන;<br>▪ ප්‍ර.කා.සා.ද. 9 සහ / හෝ ති.ස.ඉ 5 සමඟ සම්බන්ධිත ව්‍යාපෘති ලැයිස්තුව (අදාළ ක්‍රියාකාරී සැලසුම් සමඟ);<br>▪ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක නොවූ හෝ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා නොකළ හෝ අවස්ථාවක ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට පවතින අනාගත සැලසුම්. හේතු සහ පැහැදිලි කිරීම් අන්තර්ගත නිල ලේඛන ඇතුළත් වේ;<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු; සහ<br>▪ අමාත්‍යාංශයේ පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති ලැයිස්තුව. |

| | රාජ්‍ය ආයතන/ය | ආයතනයේ/වල කාර්යභාරය | ඉල්ලුම් කරන ලද තොරතුරු |
|---|---|---|---|
| 7 | අධිකරණ අමාත්‍යාංශය | ප්‍ර.කා.සා.ද. 11 ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට පත් කරනු ලැබූ අමාත්‍යාංශය | ▪ 2017-2019 කාල සීමාව තුළ සංශෝධනය කරන ලද, පනවන ලද සහ / හෝ ක්‍රියාත්මක කරන ලද වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටින් ගණන;<br>▪ ප්‍ර.කා.සා.ද. 11 සහ / හෝ ති.ස.ඉ. 5 සමඟ සම්බන්ධිත ව්‍යාපෘති ලැයිස්තුව (අදාළ ක්‍රියාකාරී සැලසුම් සමඟ);<br>▪ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක නොවූ හෝ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා නොකළ අවස්ථාවක හෝ ප්‍ර.කා.සා.ද ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට පවතින් අනාගත සැලසුම්. හේතු සහ පැහැදිලි කිරීම් අන්තර්ගත නිල ලේඛන ඇතුළත් වේ;<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී කේන්ද්‍රස්ථානයේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු; සහ<br>▪ අමාත්‍යාංශයේ පවත්වා ගෙන යනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත සමුදායන් සහ තොරතුරු පද්ධති ලැයිස්තුව. |

## ප්‍ර.කා.සා.ද. 1 - ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම

<table>
<tr><th>ලබාගත් තොරතුරු වල සාරාංශය</th><th>මූලාශ්‍රය</th><th>ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්</th><th>ප්‍රගතියේ වර්ගීකරණය</th></tr>
<tr>
<td>
1)<br>සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා 2018 සහ 2019 වර්ෂ සඳහා කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය පිළිබඳ තොරතුරු ලැබුණි.
<table>
<tr><th></th><th>කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය (%)</th></tr>
<tr><td>2019</td><td>42.9</td></tr>
<tr><td>2018</td><td>39.3</td></tr>
</table>
2)<br>මෙම ප්‍ර.කා.සා.ද හි ප්‍රගතිය පිළිබඳව රාජ්‍ය ආයතන පහක් තොරතුරු ඉදිරිපත් කර ඇති බව තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින්දක්වන ලදි. එම අමාත්‍යාංශ වනුයේ:<br>1. වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය<br>2. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>3. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය (සබරගමුව)<br>4. ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>5. රාජ්‍ය පරිපාලන, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය<br><br>3)<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද සම්බන්ධයෙන් 2018-2019 කාලය සඳහා වැඩසටහන් 3 ක් පවත්වා ඇති බවයි. ආදර්ශ ගම්මාන ව්‍යාපෘති, පාරිසරික සංචාරක ව්‍යාපාරය සහ ස්වයං රැකියා සම්බන්ධ වැඩසටහන් මීට අයත් විය වේ. මෙම වැඩසටහන් සඳහා මුළු වියදම රුපියල් මිලියන 28.03 කි.
</td>
<td>1)<br>සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br><br>2)<br>මුදල් අමාත්‍යාංශය<br><br>3)<br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය</td>
<td>මෙම ප්‍ර.කා.සා.ද ඇගැයීමේදී, ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වයේ වාර්ෂික ඉහළ යාම 0 සිට 10% දක්වා පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. 10% ට වඩා ඉහළ යාම ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදි.<br><br>ලැයිස්තුගත කර ඇති රාජ්‍ය ආයතන පහ විසින් සපයන ලද තොරතුරුවල වර්ගය හෝ තොරතුරු වලට අදාළ කාල සීමාව පිළිබඳ වැඩි විස්තර මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂවලදී පැවැත්වූ මෙම වැඩසටහන් සඳහා වූ සමස්ත වියදම්වලට අදාළව අනුබන්ඩනයක් ලබා දී නැත.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් අමාත්‍යාංශය සහ රාජ්‍ය කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා යන ආයතන වෙත ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත් හරහා ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු ලබා ගත නොහැකි විය.<br><br>කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය පිළිබඳ තොරතුරු සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මාර්ගගත පොදු අඩවියේ (online public domain) දක්වා තිබිණි. 2018 සිට 2019 දක්වා කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය 9.16% කින් ඉහළ ගොස් ඇත. 9.16% යන්න 10% සීමාවට වඩා අඩු බැවින් මෙම ප්‍ර.කා.සා.ද ප්‍රගතිය දුර්වල ලෙසට වර්ගීකරණය කර ඇත.</td>
<td>දුර්වල ප්‍රගතියකි</td>
</tr>
</table>

## ප්‍ර.කා.සා.ද. 2 - මූලයාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩි වීම

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය මෙම ප්‍ර.කා.සා.ද හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි. | **1)**<br>මුදල් අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද ඇගැයීමේදී ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාව 0 සිට 10% දක්වා වාර්ෂික ඉහළ යාමක් පෙන්වීම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. 10% ට වඩා ඉහළ යාම ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරුවල වර්ගය හෝ ඒ හා සම්බන්ධ කාල සීමාව පිළිබඳ වැඩි විස්තර මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍ර.කා.සා.ද හි ප්‍රගතිය ඇගැයීමට මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද ප්‍රගතියක් නොමැති ලෙසට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 3 - ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති බවයි.<br><br>**2)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳව රාජ්‍ය ආයතන 12ක් තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි.<br><br>මෙම රාජ්‍ය ආයතන වනුයේ:<br>1. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව<br>2. බුද්ධිමය දේපල කාර්යාලය<br>3. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>4. ඌව පළාත් සභාව - පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව<br>5. ඌව පළාත් සභාව - මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සංවර්ධන, සමුපකාර හා දෙමළ අධ්‍යාපන අමාත්‍යාංශය<br>6. උතුරු මැද පළාත් සභාව - පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය<br>7. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය<br>8. වැවිලි අමාත්‍යාංශය<br>9. තරුණ කටයුතු, කාන්තා කටයුතු, ග්‍රාම සංවර්ධන, සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය<br>10. ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>11. වරාය හා නාවික අමාත්‍යාංශය<br>12. සබරගමුව පළාත් සභාව | **1)**<br>මුදල් අමාත්‍යාංශය<br><br>**2)**<br>කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, ස්ත්‍රී පුරුෂභාවය ඇසුරින් වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 සිට 10% දක්වා පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. 10% ට වඩා ඉහළ යාමක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කළ රාජ්‍ය ආයතන සංඛ්‍යාව පිළිබඳව මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් එකිනෙකට නොගැලපෙන තොරතුරු සපයන ලදී.<br><br>මීට අමතරව, මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යන ආයතන දෙකම මෙම වාර්තා හා සම්බන්ධ කාල සීමාව නිශ්චිතව දක්වා නැත.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යන ආයතන දෙකම ලබා දුන් තොරතුරු මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය ඇගැයීමට තරම් ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති ලෙසට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 4 - ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තීය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව

**ලබාගත් තොරතුරු වල සාරාංශය**

**1)**
ජාතික තරුණ සේවා සභාව විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂයන්හි හඬු සහතික ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය සහ කාන්තාවන් සඳහා ලබා දෙන ලද මුළු රැකියා පත්වීම් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු ලබා දෙන ලදී.

| | 2018 | 2019 |
|---|---|---|
| NVQ සහතිකය ලබා ගත් කාන්තාවන් සංඛ්‍යාව | 1,263 | 1,185 |
| NVQ සහතිකය ලබා ගත් කාන්තාවන් % ලෙස | 67.9% | 66.0% |
| රැකියා පත්වීම් ලබා ගත් කාන්තාවන් සංඛ්‍යාව | 275 | අදාළ නොවේ |
| රැකියා පත්වීම් ලබා ගත් කාන්තාවන් % ලෙස | 88.7% | අදාළ නොවේ |

**2)**
තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය NVQ සහතික ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය සම්බන්ධයෙන් තොරතුරු සපයන ලදි. රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු පදනම් වී ඇත්තේ, 2018 සහ 2019 වර්ෂයන් සඳහා මූලාශ්‍ර පහකින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යා ලේඛන මත ය. ඒවා නම්:

| | 2018 | 2019 |
|---|---|---|
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) | 32.4% | 38.4% |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) | 25.8% | 30.4% |
| වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) | 38.3% | 35.3% |
| ජාතික තරුණ සේවා සභාව (NYSC) | 75.3% | 64.8% |
| පුද්ගලික ආයතන | 52.3% | 55.4% |
| එකතුව | 39.3% | 42.9% |

**3)**
තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය ප්‍රකාශ කළේ මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳව රාජ්‍ය ආයතන පහක් තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි. එම රාජ්‍ය ආයතනවනුයේ:

1. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
2. වරාය හා නාවික අමාත්‍යාංශය
3. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
4. සබරගමුව පළාත් සභාව
5. ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**මූලාශ්‍රය**

**1)**
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

**2)**
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

**3)**
මුදල් අමාත්‍යාංශය

**ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්**

මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, හඬු සහතික ලබා ගන්නා කාන්තාවන්ගේ සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 - 10% අතර පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. 10% ට වඩා ඉහළ නම් එය ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.

ජාතික තරුණ සේවා සභාව මඟින් හඬු සහතික ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය පිළිබඳව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු එකිනෙක සමාන නොවීය.

මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය මඟින් සපයන ලද තොරතුරුවල වර්ගය හෝ මෙම තොරතුරුවලට අදාළ කාල සීමාව පිළිබඳව හෝ වැඩි විස්තර ලබා දී නොමැත.

කාන්තාවන් සඳහා ලැබුණු රැකියා පත්වීම්වල ප්‍රතිශතය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකි වූයේ ජාතික තරුණ සේවා සභාවෙන් පමණක් වූ බැවින්, හඬු සහතික ලබා ගත් කාන්තාවන්ගේ ප්‍රතිශතය මත පමණක් මෙම ප්‍ර.කා.සා.ද. ප්‍රගතියේ ඇගැයීම සිදු කරන ලදි. (එම තොරතුරු නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලදි.) හඬු සහතිකය ලබා ගන්නා කාන්තාවන්ගේ ප්‍රතිශතය 2018 සහ 2019 අතර කාලයේදී 9.16% කින් ඉහළ ගොස් ඇත. මෙම අගය තක්සේරු කාල සීමාව ආරම්භයේදී තිබූ අගයට සාපේක්ෂව 10% ක ඉහළ යාමක් යන අගයට වඩා අඩු බැවින් මෙම ප්‍ර.කා.සා.ද. ප්‍රගතිය දුර්වල ලෙසට වර්ගීකරණය කර ඇත.

**ප්‍රගතියේ වර්ගීකරණය**

දුර්වල ප්‍රගතියකි

## ප්‍ර.කා.සා.ද. 5 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය/ සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායකයන්ගේ සංඛ්‍යාව

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, කර්මාන්ත හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි.<br><br>**2)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය දක්වන ලද්දේ, 2018-2019 කාල සීමාව සඳහා මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධව වැඩසටහන් 2 ක් පවත්වා ඇති බවයි. මෙම වැඩසටහන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ ඇති ව්‍යාපෘති හා ද සම්බන්ධ වේ. මෙම වැඩසටහන් සඳහා වූ වියදම් පිළිබඳ තොරතුරු සපයන ලද අතර එය රුපියල් මිලියන 70.39 කි. | **1)**<br>මුදල් අමාත්‍යාංශය<br><br>**2)**<br>කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය / සහනාධාර භාවිතා කරන කාන්තා ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 - 10% අතර පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙසට තක්සේරු කරන ලදී. 10% ට වඩා ඉහළ යාමක් නම් එය ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>කර්මාන්ත හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරුවල වර්ගය හෝ මෙම තොරතුරුවලට අදාළකාල සීමාව පිළිබඳව මුදල් අමාත්‍යාංශය වැඩිදුර තොරතුරු ලබා දී නොමැත.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂවලදී පවත්වන ලද මෙම වැඩසටහන් සඳහා වූ සමස්ත වියදම් පිළිබඳ අනුබන්ධණයක් ලබා දී නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තක්සේරුවක් කිරීමට මුදල් අමාත්‍යාංශයෙන් සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයෙන් යන දෙඅංශයෙන්ම ලැබුණු තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 6 - ආපසු පැමිණ හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)** තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. සඳහා 2018-2019 කාල සීමාව තුළ රුපියල් මිලියන 3.05 ක මුළු වියදමක් දැරීමට සිදුව ඇති බවයි. | **1)** කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය සඳහා දායක වන එක් ප්‍රතිපත්තිමය / ව්‍යවස්ථාදායී/ නියාමනික වෙනසක් අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් ලෙස ඇගයීමට ලක් කරන ලදී. ඊට අමතර වශයෙන් සිදු කරන ලද ඕනෑම වෙනසක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස ඇගයීමට ලක් කරන ලදී.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018-2019 වැඩසටහන් සඳහා වන සමස්ත වියදම් පිළිබඳ අනුබණ්ඩනයක් සපයා නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය තක්සේරු කිරීමට කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 7 - ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව

<table>
<tr><th>ලබාගත් තොරතුරු වල සාරාංශය</th><th>මූලාශ්‍රය</th><th>ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්</th><th>ප්‍රගතියේ වර්ගීකරණය</th></tr>
<tr>
<td>
1)<br>
තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වසර සඳහා මූලාශ්‍ර හතකින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව කාන්තා නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සපයන ලදී. ඒවා නම්:
<table>
<tr><th></th><th>31.12.2018 දිනට</th><th>31.12.2019 දිනට</th></tr>
<tr><td>ශ්‍රී ලංකා පරිපාලන සේවය</td><td colspan="2">*</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය</td><td>337</td><td>344</td></tr>
<tr><td>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය</td><td>295</td><td>305</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ සේවය</td><td>30</td><td>31</td></tr>
<tr><td>ශ්‍රී ලංකා සැලසුම් සේවය</td><td>අදාළ නොවේ</td><td>388</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ගිණුම් සේවය</td><td>716</td><td>877</td></tr>
<tr><td>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සේවය (1 සහ 2 පන්තිය)</td><td>130</td><td>151</td></tr>
</table>
* කාන්තා නිලධාරීන්ගේ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 2020.09.30 දින වන තෙක් පමණක් දක්වා තිබූ අතර එම සංඛ්‍යාව 1,322 ක් විය.<br><br>
2)<br>
තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් මූලාශ්‍ර පහකින් ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව කාන්තා නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී. ඒවා නම්,
<table>
<tr><th></th><th>කාන්තා නිලධාරීන් සංඛ්‍යාව</th></tr>
<tr><td>ශ්‍රී ලංකා පරිපාලන සේවය</td><td>1,235</td></tr>
<tr><td>ශ්‍රී ලංකා සැලසුම් සේවය</td><td>396</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ගිණුම් සේවය</td><td>878</td></tr>
<tr><td>ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ ගෘහ නිර්මාණ සේවය</td><td>251</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය</td><td>342</td></tr>
</table>
3)<br>
තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, 2018-2019 කාල සීමාව සඳහා මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධයෙන් රුපියල් මිලියන 4.04 ක මුළු වියදමක් දැරීමට සිදු වූ බවයි.
</td>
<td>
1)<br>
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>
2)<br>
මුදල් අමාත්‍යාංශය<br><br>
3)<br>
කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
</td>
<td>
මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, තීරණ ගැනීමේ තනතුරු හොබවන කාන්තාවන් සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 - 10% අතර පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙසට තක්සේරු කරන ලදී. එය 10% ට වඩා ඉහළ අගයක් වූයේ නම් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>
රාජ්‍ය සේවා අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සහ මුදල් අමාත්‍යාංශය යන දෙකම විසින් කාන්තා නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සපයන ලදී. කෙසේ වෙතත්, මෙම සංඛ්‍යාවට තීරණ ගැනීමේ තනතුරුවල සිටින කාන්තාවන් ද ඇතුළත් වන්නේ දැයි නිශ්චිත නැත. මීට අමතරව, එම කාන්තා නිලධාරීන් සංඛ්‍යාව අදාළ වන කාල සීමාව පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් නිශ්චිතව දක්වා නැත.<br><br>
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා සමස්ත වියදම් අනුබන්ධණයක් ලබා දී නොමැත.<br><br>
එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබුණු තොරතුරු ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත.
</td>
<td>ප්‍රගතියක් නොමැත</td>
</tr>
</table>

## ප්‍ර.කා.සා.ද. 8 - ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම

<table>
<tr><th>ලබාගත් තොරතුරු වල සාරාංශය</th><th>මූලාශ්‍රය</th><th>ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්</th><th>ප්‍රගතියේ වර්ගීකරණය</th></tr>
<tr>
<td>1)<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති බවයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට අදාළ තොරතුරු පහත දැක්වේ.
<table>
<tr><td>ළමුන් සංඛ්‍යාව</td><td>26</td></tr>
<tr><td>සේවා නියුක්තිකයන් සංඛ්‍යාව</td><td>7</td></tr>
<tr><td>වාර්ෂික වියදම (රුපියල්)</td><td>2,066,000</td></tr>
</table>
2)<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය දක්වන ලද්දේ, 2018-2019 කාල සීමාව තුළ මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධව වැඩසටහන් 2 ක් පවත්වා ඇති බවයි. මෙම වැඩසටහන් දෙක ස්ත්‍රී පුරුෂ සමානාත්මතා මූල්‍ය ප්‍රවාහය සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම හා සංවර්ධනය කිරීම යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පවත්වා ඇතමෙම වැඩසටහන් සඳහා වූ වියදම් පිළිබඳවද තොරතුරු සපයා ඇති අතර එම වියදම රුපියල් මිලියන 92.88 කි.</td>
<td>1)<br>මුදල් අමාත්‍යාංශය<br><br>2)<br>කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය</td>
<td>මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හිතකාමී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 - 10% අතර පැවතියේ නම්, එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. එය 10% ට වඩා ඉහළ අගයක් වූයේ නම් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ඔවුන්ට ලබා දී ඇති තොරතුරුවල වර්ගය හෝ මෙම තොරතුරුවලට අදාළ කාල සීමාව පිළිබඳව වැඩි විස්තර මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා වූ සමස්ත වියදම් පිළිබඳ අනුබන්ධණයක් ලබා දී නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තක්සේරුවක් කිරීමට මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යන ආයතන දෙකම ලබා දී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති ලෙසට වර්ගීකරණය කර ඇත.</td>
<td>ප්‍රගතියක් නොමැත</td>
</tr>
</table>

## ප්‍ර.කා.සා.ද. 9 - ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව

<table>
<tr><th>ලබාගත් තොරතුරු වල සාරාංශය</th><th>මූලාශ්‍රය</th><th>ලැබුණු තොරතුරු පිළිබඳ අදහස්</th><th>ප්‍රගතියේ වර්ගීකරණය</th></tr>
<tr><td>
1)<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන්, අභ්‍යන්තර ආරක්ෂණ හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් කාන්තාවන් සහ ළමුන් සඳහා පිහිටුවා ඇති සත්කාර මධ්‍යස්ථාන පද්ධති, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ආපදා කළමනාකරණ ඒකකයේ කාර්යයන් පිළිබඳව ක්‍රියාකාරී සැලසුම් ලැයිස්තුවක් සපයන ලදී.
2)<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට (SGBV) විසඳුම් ලබා දීම සඳහා ප්‍රතිපත්ති රාමු පහක් සහ ජාතික ක්‍රියාකාරී සැලසුම් ලැයිස්තුවක් මෙන්ම එම එක් එක් යෝජනාව සඳහා අයවැයක් ද මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලදි. ඒවා පහත පරිදි වේ:
<table>
<tr><th>ප්‍රධාන යෝජනා</th><th>කාල රාමුව</th><th>අයවැය (රුපියල් මිලියන )</th></tr>
<tr><td>සහන සැලසීම සහ පුනරුත්ථාපනය සඳහා නිශ්චිත පියවර සහිතව පවතින අපදා කළමනාකරණ යාන්ත්‍රණය තුළ පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සහතික කිරීම සඳහා එකී යාන්ත්‍රණය සමාලෝචනය කිරීම</td><td>2019 අවසානයේ</td><td>0.5</td></tr>
<tr><td>ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා ග්‍රාමීය මට්ටමින් ආපදා කළමනාකරණ අනු කමිටු ශක්තිමත් කිරීම.</td><td>ජනවාරි - මාර්තු 2019</td><td>1.5</td></tr>
<tr><td>මුදවා ගැනීමේ මෙහෙයුම් වලදී ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙන් ළමුන් සහ නව යොවුන් දරුවන් ආරක්ෂාව කර ගැනීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම සහ අදාළ අධිකාරීන්ට වගකීම් පැවරීම.</td><td>ජනවාරි - මැයි 2019</td><td>1.5</td></tr>
<tr><td>පොලීසි, පරිවාස, සෞඛ්‍ය වැනි සිවිල් ආරක්ෂණ ආයතන සඳහා අඛණ්ඩ සේවා සැලසුම් සකස් කිරීම.</td><td>ජනවාරි - ජූනි 2019</td><td>2.5</td></tr>
<tr><td>ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට ලක් වී ඉන් ගැලවුණු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම.</td><td>ජනවාරි - ජූනි 2019</td><td>4.0</td></tr>
</table>
</td>
<td>
1)<br>අභ්‍යන්තර ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
2)<br>මුදල් අමාත්‍යාංශය
</td>
<td>
මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය සඳහා දායක වන එක් ප්‍රතිපත්තිමය / ව්‍යවස්ථාදායි / නියාමනික වෙනසක් අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් ලෙස ඇගැයීමට ලක් කරන ලදී. ඊට අමතර ඕනෑම වෙනසක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස ඇගැයීමට ලක් කරන ලදී.
අභ්‍යන්තර ආරක්ෂණ හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ තොරතුරු ලබා දුනී නමුත්, එම සැලසුම්වල ප්‍රගතිය හෝ ක්‍රියාවට නැංවීම පිළිබඳ තොරතුරු ලබා දී නොමැත. ඊට අමතරව, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ කාල සීමාව නිශ්චිතව දක්වා නොමැත.
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සපයනු ලැබූ තොරතුරුවල වර්ගය හෝ මෙම තොරතුරුවලට අදාළ කාල සීමාව පිළිබඳ වැඩිදුර විස්තර මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී නොමැත. මීට අමතරව, ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ තොරතුරු තිබෙන නමුත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කිසිදු තොරතුරක් ලබා දී නොමැති අතර එය ප්‍ර.කා.සා.ද. හි ප්‍රධාන අංගයකි.
එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය තක්සේරු කිරීමට අභ්‍යන්තර ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත.
</td>
<td>ප්‍රගතියක් නොමැත</td></tr>
</table>

## ප්‍ර.කා.සා.ද. 10 - කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිසිය මෙම ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති බවයි.<br><br>**2)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, 2018-2019 කාල සීමාව සඳහා මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධව වැඩසටහන් 2 ක් පවත්වා ඇති බවයි. එම වැඩසටහන් ද්විත්වයම කාන්තා හා ළමා සංවර්ධන ඒකක පිහිටුවීමට අදාළ වැඩසටහන් වේ. මෙම වැඩසටහන් සඳහා වූ වියදම පිළිබඳ තොරතුරු ද සපයන ලද අතර එය රුපියල් මිලියන 38.12 කි. | **1)**<br>මුදල් අමාත්‍යාංශය<br><br>**2)**<br>කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. අගැයීමේදී, පොලිස් ස්ථාන වල පිහිටි කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාවේ වාර්ෂික ඉහළ යාම 0 සිට 10% අතර පැවතියේ නම් එය දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. එය 10% ට වඩා ඉහළ අගයක් වූයේ නම් ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිසිය සපයන ලද තොරතුරුවල වර්ගය හෝ මෙම තොරතුරුවලට අදාළ කාල සීමාව පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් වැඩිදුර තොරතුරු ලබා දී නැත.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂවලට අදාළව මෙම වැඩසටහන් සඳහා සමස්ත වියදම් පිළිබඳ අනුබන්ධණයක් ලබා දී නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය පිළිබඳ තක්සේරුවක් කිරීමට මුදල් අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යන ආයතන දෙකේම තොරතුරු ප්‍රමාණවත් නොවීය. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 11 - ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ/ හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)** තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, ඇගැයීමට අදාළ කාලය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ වූ විශේෂිත නීතිමය සංශෝධන හෝ නීති සම්මත කර නොමැති බවයි.<br><br>**2)** තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධව 2018-2019 කාල සීමාව සඳහා රුපියල් මිලියන 12.3 ක මුළු වියදමක් දරා ඇති බවයි. | **1)** අධිකරණ අමාත්‍යාංශය<br><br>**2)** කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. තක්සේරු කිරීමේදී, ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය සඳහා දායක වන එක් ප්‍රතිපත්තිමය / ව්‍යවස්ථාදායි / නියාමනික වෙනසක් අවම වශයෙන් දුර්වල ප්‍රගතියක් ලෙස ඇගැයීමට ලක් කරන ලදි. ඊට අමතර ඕනෑමවෙනස්ක් ශක්තිමත් ප්‍රගතියක් ලෙස ඇගැයීමට ලක් කරන ලදී.<br><br>අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාගත් තොරතුරු අනුව ඇගැයීමට අදාළ කාල සීමාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත විශේෂිත වූ වෙනස්කොට සැලකීමේ නීතිවලට විසඳුමක් ලබා දීම සඳහා කිසිදු උත්සාහයක් ගෙන නොමැති බව ගම්‍යවිණ.<br><br>මීට අමතරව, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂයන්හි ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන් සඳහා සමස්ත වියදම් පිළිබඳ අනුබන්ධණයක් ලබා දී නොමැත.<br><br>අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රතිචාරය මත පදනම්ව, මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## ප්‍ර.කා.සා.ද. 12 - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය

| ලබාගත් තොරතුරු වල සාරාංශය | මූලාශ්‍රය | ලැබුණු තොරතුරු පිළිබඳ අදහස් | ප්‍රගතියේ වර්ගීකරණය |
|---|---|---|---|
| **1)**<br>තොරතුරු දැනගැනීමේ අයදුම්පතට ප්‍රතිචාර වශයෙන්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දක්වන ලද්දේ, 2018-2019 කාල සීමාව සඳහා මෙම ප්‍ර.කා.සා.ද. සම්බන්ධව වැඩසටහන් 31 ක් පවත්වා ඇති බවයි. මෙම වැඩසටහන් සඳහා වූ වියදම පිළිබඳ තොරතුරු ද ලබා දී ඇති අතර එය රුපියල් මිලියන 61.72 කි. එම වැඩසටහන් වූයේ:<br><br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය අවම කිරීම අරමුණු කරගත් වැඩසටහන්.<br>▪ ළමා අපයෝජනය අවම කිරීම සඳහා ජාතික ඒකාබද්ධ ළමා ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම.<br>▪ ළමා ලිංගික අපයෝජනය තුරන් කිරීම පිළිබඳ දැනුවත්භාවය.<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම අරමුණු කරගත් වැඩසටහන් අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.<br>▪ කාන්තා සුරැකුම් මධ්‍යස්ථාන නඩත්තු කිරීම සඳහා වන මාර්ගෝපදේශ.<br>▪ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ව්‍යාපෘති<br>▪ පාසල් විෂය මාලාවට ජීවන කුසලතා සංවර්ධනය හා ලිංගික අධ්‍යාපනය ඇතුළත් කිරීම.<br>▪ පාසල් ළමා ආරක්ෂණ කමිටු පිහිටුවීම හා ශක්තිමත් කිරීම.<br>▪ "ජනපවුර ප්‍රජාපාදක" ළමා ආරක්ෂණ වැඩසටහන්.<br>▪ වැවිලි අංශයට සම්බන්ධිත ළමුන් සහ ප්‍රජාව ආරක්ෂා කිරීම.<br>▪ වෙරළ කලාපයේ මනෝ සමාජීය මැදිහත්වීම්.<br>▪ බාල වයස් ගැබ් ගැනීම් අඩු කිරීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ විද්‍යා පීඨයේ ගුරුවරුන් පුහුණු කිරීම.<br>▪ විදුහල්පතිවරුන් අතර දැනුවත්භාවය වැඩි කිරීම.<br>▪ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම.<br>▪ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලය සහ වෘත්තිකයන් පුහුණු කිරීම.<br>▪ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ වෛද්‍යවරුන් සඳහා පුහුණු කිරීම.<br>▪ ළමා නිවාස පරිපාලන අධිකාරියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.<br>▪ දරුවන් ඉල්ලක්ක කරගනිමින් සිදුවන සයිබර් අපරාධ මර්දනය කිරීම සදහා ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික ප්‍රකාශන සකස් කිරීම.<br>▪ ලෝක ළමා ශ්‍රමයට එරෙහි දිනය සහ ජාත්‍යන්තර ගැහැණු දරුවන්ගේ දිනය සැමරීම.<br>▪ විශේෂ විමර්ශන නඩු සහ අධිකරණ කටයුතු අධීක්ෂණය කිරීම.<br>▪ වින්දිත දරුවන්ට සහය දැක්වීම සඳහා වීඩියෝ සාක්ෂි භාවිතා කිරීම.<br>▪ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සහ වෙනත් ක්‍රියාකාරකම් පවත්-වාගෙන යාම.<br>▪ අන්තර්ජාල අධීක්ෂණය යටතේ විමර්ශනය.<br>▪ අන්තර්ජාල අධික්ෂණය සහ වෙනත් ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම.<br>▪ ළමා ලිංගික අපරාධකරුවන් අධීක්ෂණය කිරීම හා ඔවුන් පිළිබඳ නිරන්තරයෙන් සෝදිසි කිරීම.<br>▪ 1929 - ළමා උපකාරක දුරකථන මාර්ගයට පහසුකම් සැපයීම සහ නඩත්තු කිරීම.<br>▪ ළමා ආරක්ෂණ මධ්‍යස්ථාන නියාමනය අධීක්ෂණය කිරීම සහ මනෝ සමාජීය සහාය ලබා දීම.<br>▪ ආපදා කළමනාකරණ නිලධාරීන් පුහුණු කිරීම සහ ආපදා සහන සේවා සැපයීම.<br>▪ පොදු ප්‍රවාහනවලදී සිදුවන ලිංගික හිරිහැර සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීම.<br>▪ පොදු ප්‍රවාහනවලදී සිදුවන ලිංගික හිරිහැර දැනුම් දීම සහ අවම කිරීම සඳහා මොඩියුල නිර්මාණය කිරීමග | **1)**<br>කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | මෙම ප්‍ර.කා.සා.ද. ඇගැයීමේදී, 0- 10% අතර ප්‍රමාණයකින් වාර්ෂිකව ප්‍රතිපාදන ඉහළ යාම දුර්වල ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී. ප්‍රතිපාදන 10% ට වඩා ඉහළ යාම ශක්තිමත් ප්‍රගතියක් ලෙස තක්සේරු කරන ලදී.<br><br>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2018 සහ 2019 වර්ෂයන්හි ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන් සඳහා සමස්ත වියදම් පිළිබඳ අනුබන්ඩණයක් ලබා දී නොමැත.<br><br>එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලබාගත් තොරතුරු ප්‍ර.කා.සා.ද. හි ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණවත් නොවූ අතර එයට හේතු වුයේ, කාලාන්තරව වියදම් වෙනස් වූයේ කෙසේද යන්න නිශ්චය කිරීමට නොහැකි වීමයි. එබැවින් මෙම ප්‍ර.කා.සා.ද. කිසිදු ප්‍රගතියක් නොමැති බවට වර්ගීකරණය කර ඇත. | ප්‍රගතියක් නොමැත |

## 2018 අයවැය කැඳවීම සඳහා අතිරේකය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 12 (ප්‍ර.කා.සා.ද.)

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET
මහා භාණ්ඩාගාරය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத்திறைசேரி, நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு, கொழும்பு 01, இலங்கை
General Treasury, Ministry of Finance and Mass Media, Colombo 01, Sri Lanka
Web Site: www.treasury.gov.lk e-mail: budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. BD/CBP/4/1/2-2018 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017.07.31

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**<u>අයවැය කැඳවීම - 2018 සඳහා අතිරේකය (II)</u>**
**<u>2018 අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ</u>**

මෙය "වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ" පිළිබඳ 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017 ට වැඩිමනත් වශයෙනි. මෙම අතිරේකයේ දී රජය විසින් පිළිගනු ලැබ ඇති නව ප්‍රතිපත්තිමය උපායමාර්ග තුන සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම පිළිබඳව තවදුරටත් මාර්ගෝපදේශ ලබාදීමට අපේක්ෂා කෙරේ.

1. තිරසර සංවර්ධන අරමුණු
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය
3. ආබාධිත පුද්ගලයින් සවිබල ගැන්වීම

**(1) තිරසර සංවර්ධන අරමුණු**

1.1 දර්ශක 244 කින්, ඉලක්ක 169 කින් සහ අරමුණු 17 කින් සමන්විත වන 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට එකඟවීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. තිරසර සංවර්ධන අරමුණු (SDG) වලින් අපේක්ෂා කෙරෙනුයේ දරිද්‍රතාවය, කුසගින්න සහ අසමානතාවය අවසන් කිරීම, පරිසරය සුරැකීම, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙත ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම, සාමය ගොඩනැඟීම, සාධාරණත්වය සහ ශක්තිමත් ආයතන ස්ථාපිත කිරීම යනාදියයි. මෙම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම අයවැයකරණය සමග සෘජුවම, එනම් හඳුනා ගත් ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා සම්පත් වෙන් කිරීම සිදුවිය යුතුය. එබැවින්, 2018 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අරමුණු (SDG), ජාතික සංවර්ධන උපායමාර්ග සමග එක්ව පෙළ ගැස්වීමට අපේක්ෂා කෙරේ. අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සැලසීමට සහ ඒවා අධීක්ෂණය කිරීම සඳහා තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක්ද පිහිටුවා ඇත.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General 0094-11-2484665, 0094-11-2484639 (Fax) | කාර්යාලය / அலுவலகம் / Office 0094-11-2484669, 0094-11-2484853 | ෆැක්ස් අංකය / தொலைநகல் இல / Fax No. 0094-11-2484807

1.2 එම නිසා, වර්තමාන සහ අනාගත සංවර්ධන කටයුතු තුළ තිරසර සංවර්ධන අරමුණු සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම සහ වාර්ෂික අයවැය සමග පෙළගැස්වීම සඳහා වියදම් කිරීමේ ආයතනවලට මාර්ගෝපදේශ ලබා දේ. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වන්නේ වියදම් කිරීමේ ආයතනයට විශේෂිතවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණුවල විශ්ව න්‍යාය පත්‍රය හඳුනා ගැනීම හා දේශීයකරණය කිරීම සහ එම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සෘජුවම උපකාරී වන සංවර්ධන උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම වේ.

1.3 තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ 2030 න්‍යාය පත්‍රය අධීක්ෂණය කිරීම සඳහා තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය මගින් අදාළ අමාත්‍යාංශ වෙත පහසුකම් සපයනු ඇත. තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ජාතික සංවර්ධන රාමුව තුළට අනුගත කිරීම පිළිබඳව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහතික වනු ඇති අතර, සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සැලසුම් කිරීමේදී ඒවා ඇතුළත් කිරීම පිළිබඳ වගකීම රේඛීය අමාත්‍යාංශ මගින් දරනු ලැබේ.

1.4 2030 වර්ෂය අවසානයේ දී තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනු ලැබ තිබේද යන්න පිළිබඳව සහතික වීම පිණිස තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවද සහාය දක්වයි. ඒ ඒ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවලට අදාළ වන තිරසර සංවර්ධන අරමුණු හි දර්ශක දේශීයකරණය කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු දර්ශකයන්හි තත්ත්වය : 2017 ( Status of Sustainable Development Goals Indicators in Sri Lanka:2017 ) ආශ්‍රිත කරගත හැක.

**(2) ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය**

2.1 තිරසර සංවර්ධන අරමුණු අංක 5 හි දැක්වෙනුයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වේ. ශ්‍රී ලංකාවේ මුළු ජනගහණයෙන් අඩකටත් වඩා නියෝජනය කරනු ලබන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමුන් බැවින්, සම්පත් වෙන්කිරීමේදී හැකි සෑම අවස්ථාවකදීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කළයුතුය. ඒ අනුව, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අමාත්‍යාංශවලට සළකා බැලීම සඳහා, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් සකස් කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇමුණුම I හි දක්වා ඇති අතර, වර්ෂ 2018 දී ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යසාධන දර්ශක සඳහන් කළයුතු වේ.

2.2 2016.06.07 දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, 2017-2019 දක්වා වන මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ආරම්භ කිරීමට නියමිතය. මෙම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අරමුණ වනුයේ " කාන්තාවන් සහ ළමුන්ට ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක් " යන්නයි. මෙම සැලසුම මගින් බහු ආංශික ක්‍රියාත්මක කිරීම් ආවරණය වන බැවින්, අදාළ රේඛීය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් විසින් සැලසුම් පිළිපැදීම සඳහා අවශ්‍ය පියවරයන් ගත යුතුය.

2

**(3) ආබාධිත පුද්ගලයින් සවිබල ගැන්වීම**

3.1 2018 අයවැයේ දී සලකා බැලිය යුතු තවත් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ ආබාධිත පුද්ගලයින්ට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීමයි. ජාතික ආබාධිත ප්‍රතිපත්තිය මත පදනම්ව සකස් කරනු ලැබ ඇති සහ සවිබල ගැන්වීම, සෞඛ්‍ය සහ පුනරුත්ථාපනය, අධ්‍යාපනය, රැකියා සහ සේවා නියුක්තිය, පරිසරය, දත්ත හා පර්යේෂණ සහ සමාජ ආයතනික ඒකාබද්ධතාවය සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබාදීම හා ශක්තිමත් කිරීම යන තේමාගත ක්ෂේත්‍ර 7 ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති " ආබාධිතභාවය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම " ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය දැනටමත් නිර්දේශ කර ඇත. රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, ආබාධිත ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වන ක්ෂේත්‍රයන් හා අදාළ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ ඔවුන් සමාජයේ සම ඵලදායී කාණ්ඩයක් ලෙස ඉදිරියට මෙහෙයවීම සියලුම වියදම් කිරීමේ ආයතන මගින් සිදුකිරීම අවශ්‍ය වේ.

(4) 2018 අයවැය, කාර්ය සාධනය මත පදනම් වූ අයවැයකරණය මත සකස් කෙරෙන බැවින්, මැනිය හැකි නිමැවුම් / ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා සම්පත් ඉල්ලා සිටීමේදී ඉහත කරුණු පිළිබඳව සැළකිලිමත් වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

(5) ඉහත කරුණු පිළිබඳව ඔබට යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ විෂය නිලධාරියා ඇමතීමට කාරුණික වන්න.

**අත්.කළේ / කේ.ඩී.එස්.රුවන්චන්ද්‍ර**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්:

I. ජනාධිපති ලේකම්
II. අග්‍රාමාත්‍ය ලේකම්
III. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
IV. විගණකාධිපති

3

ඇමුණුම 01

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය ළඟාකර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා වන ප්‍රධාන කාර්යසාධන දර්ශක**

1. ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්ව ප්‍රතිශතයේ වැඩිවීම
2. මූලාධාර වැඩසටහන් මගින් නිවාස ඉදිකර ඇති ස්ත්‍රී මූලික කුටුම්භයන් සංඛ්‍යාවේ වැඩිවීම
3. ස්ත්‍රී පුරුෂ භාවය වෙන්කර දත්ත ලබාගත හැකි දත්ත පද්ධති පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව
4. ජාතික වෘත්තීය පුහුණු සහතිකය (NVQ) ලබාගෙන ඇති ඉහළ කාන්තා ප්‍රතිශතයේ වැඩිවීම සහ කාර්මික වෘත්තිය ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වී ඇති සංඛ්‍යාව
5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය / සහනාධාර භාවිතා කරමින් තිරසර ව්‍යාපාරයන්හි නිරත වන කාන්තා ව්‍යවසායිකාවන් සංඛ්‍යාව
6. ආපසු පැමිණි හා විදෙස්ගත වීමට නියමිත කාන්තාවන් ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව
7. ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා ලබාගත්, තීරණ ගැනීමේ තනතුරු හොබවන ඉහළ කාන්තාවන් සංඛ්‍යාව
8. ස්ත්‍රී පුරුෂ මිත්‍රශීලී රැකියා පරිසරයක් සහ දිවා සුරැකුම් පහසුකම් ආදිය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් ගෙන ඇති ආයතන සංඛ්‍යාවේ වැඩිවීම
9. ආපදා අවස්ථාවල දී මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය යන පියවරයන්හි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම සහතික වීම සඳහා පවතින ඵලදායී ලෙස ක්‍රියාත්මක වී ඇති ප්‍රතිපත්තීන් සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව
10. කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු සංවේදී සහ ඵලදායී අයුරින් හැසිරවීම සඳහා ධාරිතාවය ඉහළ නැංවූ පොලිස් ස්ථාන වල ඇති කාන්තා හා ළමා කාර්යාංශ සංඛ්‍යාව
11. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වෙනස්කම් සහිත නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සංශෝධනය කර ඇති පනවා ඇති සහ / හෝ ක්‍රියාත්මක කර ඇති සංඛ්‍යාව
12. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය විසඳීම සඳහා වූ බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම අනුපූරණය කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය

4

ISBN 978-624-5514-16-8

Verité Research
Strategic Analysis for Asia

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org